# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2075/26 - 2018 ජුනි මස 13 වැනි බදාදා - 2018.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පොලිස් නිලධාරීන් බඳවා ගැනීම, පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම සහ විනය පාලනය සම්බන්ධ රෙගුලාසි

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඊඊඊ යන වගන්තිය යටතේ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පනවනු ලබන රෙගුලාසි.

පී. එච්. මනතුංග,
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2018 ජුනි මස 11 වැනි දින,
කොළඹ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි පොලිස් නිලධාරීන් බඳවා ගැනීම, පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම හා විනය පාලනය පිළිබඳ රෙගුලාසි වශයෙන් හඳුන්වනු ලැබේ. මෙම රෙගුලාසි 2018 මැයි 08 වන දින ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

2. පොලිස් නිලධාරීන්ගේ තනතුරු වලට අයදුම්කරුවන් තෝරා ගැනීම, බඳවා ගැනීම, පත් කිරීම සඳහා පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවලට සභාපතිවරුන් සහ සාමාජිකයින් පත්කිරීමේ දී ජාතික පොලිස් කොමිෂන් සභාවට එකී මණ්ඩලවල සභාපතිවරයා පත් කළ හැකි ය.

3. ඉහත අංක 02 දරන රෙගුලාසිය ඊට පටහැනි දනට බලපවත්නා රෙගුලාසියක් හෝ ක්‍රියාපටිපාටියක් තිබුණද එය නොසලකා පොලිස් නිලධාරීන් බඳවා ගැනීම හා පත් කිරීමේ දී බල සහිත වනු ඇත.

06 - 1016


1A - PG 4078 — 107 (2018/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*